# දකුණු ආසියානු කලාපයේ දේශපාලනය තුළ ආගමික මතවාදයේ බලපෑම

තිළිණි අරෝෂා කුමාරි[1]

## හැඳින්වීම

දකුණු ආසියානු කලාපය ලෝකයේ අනෙකුත් දේශපාලන කලාපයන්ට සාපේක්ෂව විවිධත්වයෙන් යුක්ත වූ සංස්කෘතීන් හරහා ගොඩනැගුනු ජාතීන් සහිත බහු වාර්ගික කලාපයකි. වාර්ගික ජන සමාජ, විවිධ ආගම්, සංස්කෘතීන් හා විවිධ වූ භාෂාවන් කතා කරන විශාල ජනගහනයක් මෙහි ජීවත් වන අතර සාක් සංවිධානයට අයත් රාජ්‍යයන් වන ඉන්දියාව, ශ්‍රී ලංකාව, පාකිස්ථානය, බංගලාදේශය, නේපාලය, භූතානය, මාලදිවයින හා ඇෆ්ඝනිස්ථානය කලාපයට අයත් රාජ්‍යයන් වේ. කලාපයේ බලවතා වශයෙන් ඉන්දියාව කටයුතු හෙයින් "උප ඉන්දියානු අර්ධද්වීපික කලාපය" ලෙසද අර්ථකථනය කරනු ලැබේ.

දකුණු ආසියානු කලාපයේ පවතින විවිධත්වය හේතුවෙන් බොහෝ රටවල අභ්‍යන්තර වශයෙන් හා බාහිර වශයෙන් ගැටුම් නිර්මාණය වී තිබේ. එම ගැටුම් බොහෝමයකට ආගමික සාධකය සෘජු හෝ වක්‍රව බලපෑම්කර තිබේ. මිනිසාගේ විශ්වාසය මත පදනම් වූ සංවේදී සාධකයක් වන ආගම කෙරෙහි පවතින භක්තිය හා විශ්වාසය නිසා ස්වකීය ආගම ආරක්ෂා කර ගැනීමට මිනිසුන් කටයුතු කරයි. බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කිතුනු හා කතෝලික ධර්මය විවිධ ආගම් අදහන විවිධ ජන කොට්ඨාසවලින් දකුණු ආසියානු කලාපයේ සමාජ පරිසරය ගොඩනැගී ඇති අතර එය දේශපාලනයේ ද ප්‍රධාන සාධකයක් ද වේ.

අතීතයේ ආර්යයන් ඉන්දු නිම්න ශිෂ්ටාචාරය මුල් කරගෙන ජනාවාසයක් නිර්මාණය කරගැනීමෙන් පසු ආගමනය වූ විවිධ සංක්‍රමණිකයන් හරහා බහුවිධ සමාජයක් ලෙසට දකුණු ආසියානු කලාපය පරිවර්තනය විය. පසුකාලීනව මෙසේ ඇති වූ බහුවිධතාවය නිසා ආගමික සාධකය පදනම් කරගෙන ආසියානු කලාපයේ රාජ්‍යයන් ගණනාවකම ගැටුම් නිර්මාණය වී ඇත. ඉන්දියාවේ අයෝධ්‍යා ගැටුම, සික් අර්බුදය, ඇෆ්ඝනිස්ථාන් බාමියන් බුදුපිළිම විනාශය, බංගලාදේශයේ චිතගෝන් ආගමික ගැටුම නිදසුන් වන අතර එම ගැටුම් බොහෝමයකට ආගමික සාධකය බලපා ඇත. ඉන්දියාවේ පවතින සංස්කෘතිකමය විවිධත්වය අනෙකුත් දකුණු ආසියාතික රාජ්‍යයන්ට සාපේක්ෂව ආගමික වශයෙන් අභ්‍යන්තර අරගල හට ගැනීමට හේතු විය. එනිසාවෙන් ඉන්දියාවේ අයෝධ්‍යා ගැටුමට හා සික් ගැටුම් දිගු

[1] නිබන්ධ උපදේශිකා, දේශපාලන විද්‍යා අධ්‍යයන අංශය, ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, thiliniarosha@gmail.com

කාලයක් තිස්සේ නොවිසඳුනු ගැටුම් ලෙසට පරිවර්තනය වී ඇත්තේ ආගමික සාධකයේ තීව්‍ර බව සනාථ කරමිනි.

එසේම බංගලාදේශයේ ද චිතගෝන් කඳුකර ප්‍රදේශයේ ජීවත්වන ගෝත්‍රික ජනකණ්ඩායම අතර ඇති වූ වාර්ගික ගැටුමේ එක් සාධකයක් වන්නේ ද ආගමික සාධකයි. චිතගෝන් ප්‍රදේශයේ බෞද්ධාගමිකයින් හා ඉස්ලාම් භක්තිකයින් අතර ඇතිවී තිබෙන මෙම අර්බුදය ද ආගමික සාධකය මත දික්ගැසුණු සමාජ ගැටුමක් බවට පරිවර්තනය වූ නමුත් පසුව සාකච්ඡා මාර්ගයෙන් එය විසඳාගනු ලැබීය. සෙසු ආගම්වලට සාපේක්ෂව බුදුදහමේ පවතින වෛර නොකිරීම හා අවිහිංසාවාදී සංකල්ප පදනම් කරගනිමින් ඇති වූ සාකච්ඡාමය එකඟතා මත එම ගැටුම සමථයකට පත් කර ගත්තේ එක් පසෙකින් බෞද්ධ ආගම වැනි ආගම් ගැටුම් නිරාකරණයෙහිලා ද වැදගත්ව ඇති බව පසක් කරමිනි. ඇමරිකානු ජාතිකයකු වූ නක්ලා බැසිල් නක්ලා විසින් 2012 වර්ෂයේ නිර්මාණය කරනු ලැබූ *'Incent of Muslim'* නැමැති චිත්‍රපටය හරහා ගොඩනැගුණු මතවාදීමය සංසිද්ධියක් මුල් කරගෙන බංගලාදේශයේ නිර්මාණය වූ සිවිල් අරගලකාරී තත්ත්වයට ආගමික සාධකය සෘජුව ම බලපානු ලැබීය. එම චිත්‍රපටය හරහා මුස්ලිම් ආගම ගර්හාවට ලක් කළ බවට චෝදනා කරමින් දකුණු ආසියාව ඇතුළු බොහෝ ඉස්ලාමීය රාජ්‍යයන් එරෙහිව නැගී සිට චිත්‍රපටය තහනම් කිරීමට කටයුතු කරනු ලැබීය. නක්ලා බැසිල් බෞද්ධ සම්භවයක් සහිත පුද්ගලයකු නිසා බංගලාදේශයේ ඉස්ලාම් භක්තිකයන් විසින් දැවැන්ත විරෝධතා ව්‍යාපාරයන් ගෙන යමින් එරට බෞද්ධ වෙහෙර විහාර හා බුදුපිළිම විනාශ කරන ලැබුවේද ආගමික සාධකයේ සංවේදී බව පසක් කරමිනි. ඒ පසුබිම මත බංගලාදේශයේ බෞද්ධ උරුමයන් විනාශ කිරීම ශ්‍රී ලංකාව දැඩිව විවේචනය කළ අතර එයට එරෙහි විරෝධාතා නිර්මාණය වීමට පවා බලපානු ලැබීය.

ශ්‍රී ලංකාවේ ද මෑත කාලීනව ආගමික සාධකය මුල්කරගනිමින් අභ්‍යන්තරික වශයෙන් ගැටුම්කාරී තත්ත්වයක් නිර්මාණය වෙමින් පවතින බව දැකගත හැක. බුදුදහමේ ආභාසය සහිත බහුතර බෞද්ධාගමික ජන කණ්ඩායම් ජීවත් වන ශ්‍රී ලංකාවේ බෞද්ධ ජනතාව හා මුස්ලිම් ජනතාව (ඉස්ලාම්) අතර පවතින මතවාදී අර්බුදය පසුගිය ජූලි මාසයේ අළුත්ගම ප්‍රදේශයේ දර්ගා නගරය කේන්ද්‍ර කරගෙන නොසන්සුන්කාරී තත්ත්වයක් ඇතිවීමට බලපානු ලැබීය. බුදු දහමේ ආරම්භය හා ප්‍රවර්ධනය දකුණු ආසියානු කලාපය මුල්කරගනිමින් ගොඩනැගුනු නිසාවෙන් සෙසු ආගම්වලට සාපේක්ෂව ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයන්හි බෞද්ධාගමික සාධකයට ප්‍රමුඛත්වයක් හිමිව පවතී. එම තත්ත්වය තුළ ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයන්හි ආගමික වශයෙන් ගැටුම් නිර්මාණය වීමට වැඩි පසුබිමක් ඇති විය හැකි අතර බුදු දහමේ ආභාසය ලද බෞද්ධ රාජ්‍යයක් වශයෙන් ආගමික සහජීවනය අගය කරමින් එවැනි ගැටුම් අනුමත කිරීමට නොහැකි නමුත් මතවාදීමය සාධක පිළිබඳ විමර්ශනය කරන කල්හි බුදුදහමේ ප්‍රවර්ධනය හා

ආරක්ෂාව වෙනුවෙන් බෞද්ධාගම ආරක්ෂා කර ගැනීමටත්, පිරිසිදු ථෙරවාදී බුදුදහම රැක ගැනීමට පියවර ගැනීම සුදුසු බව පසක් කරගත යුතුවේ.

ඒ අනුව දකුණු ආසියානු කලාපයේ ඇති වූ බොහෝ සන්නද්ධ අරගලයන් හා ගැටුම්කාරී තත්ත්වයන් ඇති වීමට ආගමික සාධකය බලපා ඇති බව පැහැදිලි වේ. ජනගහනයේ විශාලත්වය, බහුවිවිධත්වය, බහු සංස්කෘතිය ද බහු ආගමිකත්වය මෙවැනි තත්ත්වයන් ඇතිවීමට බලපා ඇති අතර ආසියාවේ සෙසු කලාපයන්ට සාපේක්ෂව සමාජ සංවර්ධන, දේශපාලන සමාජානුයෝජන පහළ මට්ටමක පැවතීම හා නොදියුණු දේශපාලන සංස්කෘතියක් සහිත ජනතාවක් ජීවත්වීම තුළ ආගම පිළිබඳව මිනිසුන් තුළ පවතින විශ්වාසය හා මතවාදී සාධක ගැටුම් නිර්මාණය වීමට බලපා තිබේ. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් දකුණු ආසියාතික කලාපය තුළ අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීමට ආගමික සාධකය බලපානු ලබන ආකාරය පිළිබඳව අධ්‍යයනය කර ඇත.

මෙවැනි තත්ත්වයන් සමථකරණයෙහි ලා ප්‍රතිපත්ති නිර්මාණය කිරීම වැදගත් වන අතර එහිදී පුද්ගල ආකල්ප හා මතවාද වෙනස් කිරීමට අවැසි ක්‍රමවේදයන් ඇති කිරීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීමත්, ආගමික සහජීවනය ඇති කිරීම සඳහා රාජ්‍ය මැදිහත්වීම යනාදී ප්‍රතිපත්තිමය විසඳුම් ලබාදීම වැදගත් බව අධ්‍යයනය මගින් හඳුනාගනු ලැබීය.

**අධ්‍යයනයේ අරමුණු**

- දකුණු ආසියානු කලාපයේ ගැටුම් නිර්මාණය වීමට බලපා ඇති සාධක පිළිබඳව අධ්‍යයනය කිරීම.
- අනෙකුත් සාධකවලට සාපේක්ෂව ආගමික සාධකය දකුණු ආසියානු කලාපයේ ගැටුම් නිර්මාණයෙහි ලා බලපානු ලබන ආකාර සොයා බැලීම.
- සෙසු ආගම්වලට සාපේක්ෂව බුදුදහමේ හරයාත්මක සාධක ඇසුරින් ගැටුම් සමථයකට පත් කරගැනීමට ගත හැකි ක්‍රමවේදයන් පිළිබඳව අධ්‍යයනය කිරීම.

**පර්යේෂණ ගැටලුව**

දකුණු ආසියානු දේශපාලන සමාජයේ අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීම කෙරෙහි ආගමික සාධකය බලපානු ලබන්නේ ඇයි?

**අධ්‍යයනයේ වැදගත්කම**

මෙම අධ්‍යයනය විෂයානුබද්ධව, පර්යේෂණාත්මකව හා ජාතික වැදගත්කමකින් යුක්ත වේ. කලාපයක් වශයෙන් දකුණු ආසියාතික කලාපය දේශපාලනය අධ්‍යයනයේදී වැදගත් කලාපයක් වන අතර එම කලාපයේ පවතින

අභ්‍යන්තර අරගල හේතුවෙන් කලාපයේ ආරක්ෂාව හා අභ්‍යන්තර සාමය පිළබඳව අර්බුදකාරී පසුබිමක් නිර්මාණය වී ඇත. එවැනි පසුබිමක් තුළ බහු වාර්ගික හා බහු ආගමික කලාපයක් ලෙස ගැටුම් නිර්මාණය වීමෙහි ලා ආගමික සාධකය බලපානු ලබන්නේ කෙසේද යන ජාතික වැදගත්කමින් යුක්ත මෙම ගැටලුව පිළිබඳව පර්යේෂණාත්මකව විමර්ශනය කිරීමෙහි ලා මෙම අධ්‍යයනය වැදගත් විය.

## අධ්‍යයන ක්‍රමවේදය

පර්යේෂණයේ ස්වාභාවය අනුව විශ්ලේෂණයට ලක්කරනු ලබන ක්ෂේත්‍රයන් ඔස්සේ උචිත ක්‍රමවේදයන් භාවිතා කරමින් ගනු ලැබූ තොරතුරු මගින් මෙම පර්යේෂණය සිදුකරයි. අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබූ විෂය ක්ෂේත්‍රයට අදාළ පොත්පත්, සඟරා පුවත්පත් මගින් හා අන්තර් ජාලය ඇසුරින් රැස් කරගනු ලැබූ ද්විතීක දත්ත මගින් ද, ප්‍රාථමික දත්ත ලෙස අදාළ ක්ෂේත්‍රයන් හා සම්බන්ධව තානාපතිවරු හා මහකොමසාරිස්වරු, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, දේශපාලන විචාරකයින් හා විශ්ලේෂකයින් සමග සිදුකරනු ලැබූ සම්මුඛ සාකච්ඡා මගින් පර්යේෂණයට අදාළ දත්තන එක් රැස්කර ගනිමින් ප්‍රමාණාත්මක හා ගුණාත්මක ලෙස විශ්ලේෂණය කරමින් අධ්‍යයනය සිදුකරනු ලැබීය.

**ප්‍රමුඛ පදඃ** ආගමික සාධකය, දකුණු ආසියාතික කලාපය, බහුවිවිධත්වය, බහු සංස්කෘතිය, ආගමික සහජීවනය

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කරුණාදාස ඩබ්. එම්, (2005). *දකුණු ආසියානු දේශපාලනය.* දෙහිවලඃ ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.

ෆාරුක් ලතීෆ්; (පරිවර්තන කේ.ජී.එන්. පෙරේරා), (2007). *ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ සැබෑ මුහුණුවර.* පිළියන්දලඃ රාවය ප්‍රකාශන.

Baxter Craig, Malik k Yogendra, Kennedy H. Charles, Oberst C. Robert, (1998). *South Asia-Politics And Government*. Boulder CO, West views Press.

V. Ashuthush, (2010). *Ethnic and regional conflicts in India*. India: CSQ publisher.

V.V. Dyke (2009). *The Kalistah Movement in Panjab and the post militancy era*. Asian Server, Vol 49, p. 975.